# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## තනතුරු ඇබෑර්තු

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## සහකාර අධ්‍යක්ෂ (බාහිර)

(අදාළ විෂයය ක්ෂේත්‍ර පහත සඳහන් වේ)

| තනතුර | රැකියා විස්තරය |
|---|---|
| **සහකාර අධ්‍යක්ෂ**<br>(තරඟකාරිත්ව) | 01. රටේ විදුලි සංදේශ නියාමනයේ ආර්ථික හා මූල්‍ය අංශවලට අදාළ සියලුම තරඟකාරීත්ව ගැටළු මෙහෙයවීම.<br>02. ජාත්‍යන්තරව විදුලි සංදේශ අංශයේ මූල්‍ය ප්‍රවණතා නිරීක්ෂණය කිරීම හා පුරෝකථනය කිරීම මෙන්ම දේශීය අංශයේ ආර්ථික බලපෑම් තක්සේරු කිරීම.<br>03. සාධාරණ තරඟකාරිත්වය සඳහා අයක්‍රම සහ පිරිවැය විශ්ලේෂණ ව්‍යුහය නැවත සකස් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.<br>04. සියලුම අයක්‍රම පිළිබඳ අයදුම්පත් සැකසීම සහ විශ්ලේෂණය කිරීම මෙන්ම නිර්දේශ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.<br>05. ක්‍රියාකරු සහ ආංශික විශ්ලේෂණයන් සිදු කිරීම සහ මෙහෙයවීම මෙන්ම විශේෂ ප්‍රවණතා හඳුනා ගැනීම සහ සමාජ-ආර්ථික සංවර්ධනය කෙරෙහි ඒවායේ බලපෑම් තක්සේරු කිරීම.<br>06. නියාමන අරමුණු සඳහා විදුලි සංදේශ ක්‍රියාකරු පිරිවැය සහ ආදායම පිළිබඳ ආකෘති සැකසීම හා මූල්‍ය විශ්ලේෂණය මෙහෙයවීම.<br>07. ක්‍රියාකරුවන් සහ දේශීය අංශය සඳහා ආදායම් සහ පිරිවැය ඉලක්ක ස්ථාපිත කිරීම. |
| **සහකාර අධ්‍යක්ෂ**<br>(ජාල) | 01 විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ ආරවුල් සම්බන්ධීකරණය කිරීම හා නිරාකරණය කිරීම.<br>02. විදුලි සංදේශ යටිතල පහසුකම් පිළිබඳ දත්ත සමුදාය පවත්වා ගැනීම<br>03. විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සඳහා සම්ප්‍රේෂණ සැලසුම් අනුමත කිරීම.<br>04. යටිතල පහසුකම් හවුලේ පරිහරණය කිරීමේ දී ක්‍රියාකරුවන්ට සහාය වීම.<br>05. විදුලි සංදේශ අයිතම ආනයනය සහ අපනයනය පිළිබඳ මාදිලි අනුමැති සහතික සහ නිෂ්කාශන සහතික පරීක්ෂා කිරීම, ඇගයීම සහ නිකුත් කිරීම<br>.06. අන්තර් ක්‍රියාකාරීත්වය සහ අන්තර් සම්බන්ධතා ජාලය පිරික්සීම<br>07. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශය සඳහා අංකන ක්‍රමය ක්‍රියාත්මක කිරීම.<br>08. ගුවන්විදුලි සම්ප්‍රේෂණය, කුළුණු, මූලික මධ්‍යස්ථාන ස්ථාපනයන් සහ විද්‍යුත් චුම්භක විකිරණ බලපෑම් පිළිබඳ මහජන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.<br>09. රටේ පහත සඳහන් ක්ෂේත්‍රවල නව විදුලි සංදේශ පහසුකම් අධීක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම.<br>i. නව පරම්පරාවේ ජාල සහ ආරක්ෂක කරුණු ආශ්‍රිත ජාල<br>ii. අන්තර්ජාල යෙදුම් (IP) හඬ සහ අන්තර්ජාලය පදනම් කරගත් සේවා ජාල<br>iii. නිෂ්පාදන සහ තාක්ෂණික අනුකූලතාව<br>iv තොරතුරු තාක්ෂණය සහ වෙබ් අඩවි<br>v. නව තාක්ෂණික ප්‍රමිතීන්<br>vi. සේවා අන්තර් ක්‍රියාකාරීත්වය<br>10. විදුලි සංදේශ පර්යන්ත උපකරණවල පිරිවිතරයන් සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම.<br>11. නව විදුලි සංදේශ උපකරණ සහ උපාංග සම්බන්ධයෙන් තාක්ෂණික පරීක්ෂණ පැවැත්වීම. |
| **සහකාර අධ්‍යක්ෂ**<br>(මූල්‍ය) | 01. මූල්‍ය සැලසුම්කරණය, ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් සියලුම මූල්‍ය කටයුතු සඳහා අධ්‍යක්ෂ (මූල්‍ය) වෙත සහාය වීම.<br>02 අයවැය, වාර්ෂික මූල්‍ය වාර්තා සහ අනෙකුත් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම<br>03 ආදායම් සහ වියදම් ගිණුම් කළමනාකරණය කිරීම<br>04. ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් සියලුම පොත්, ලෙජර්, බැංකු ප්‍රකාශන සහ අනෙකුත් ලේඛනවල ගෙවීම් සහතික කිරීම සහ අධීක්ෂණය කිරීම.<br>05. ආදායම් එකතු කිරීම් සහ අදාළ වාර්තා සහ ලේඛන අධීක්ෂණය කිරීම.<br>06. භාණ්ඩාගාරය සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අධිකාරීන් සඳහා මාසික, කාර්තුමය සහ වාර්ෂික ගිණුම් සහ වාර්තා සකස් කිරීම.<br>07. ප්‍රසම්පාදන කමිටු සහ අදාළ කරුණු සඳහා සහභාගී වීම. |
| **සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති යටිතල පහසුකම් නඩත්තු සහ සංවර්ධන** | 01. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ යටිතල පහසුකම් වත්කම් ලේඛනය සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.<br>02. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සියලුම යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා වාර්ෂික නඩත්තු වැඩසටහනක් සකස් කිරීම.<br>03. . ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ යටිතල පහසුකම් සඳහා වාර්ෂික නඩත්තු අයවැය සකස් කිරීම සහ අනු කොන්ත්‍රාත්තු ඇතුළු සියලුම නඩත්තු කටයුතුවලට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම මෙන්ම බාහිර ආයතන සමඟ නඩත්තු කොන්ත්‍රාත්තු/ගිවිසුම් අත්සන් කිරීම..<br>04. කෙටි කාලීන/මධ්‍ය කාලීන/දිගු කාලීන යටිතල පහසුකම් ප්‍රධාන සංවර්ධන සැලැස්ම (IDMP) සහ අයවැය සකස් කිරීම සඳහා ඔවුන්ගේ වර්තමාන සහ අනාගත යටිතල පහසුකම් අවශ්‍යතා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අංශ සමඟ එක්ව කටයුතු කිරීම.<br>05. යටිතල පහසුකම් ප්‍රධාන සංවර්ධන සැලැස්ම (IDMP) අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කෙටි කාලීන/මධ්‍ය කාලීන/දිගු කාලීන යටිතල පහසුකම් අවශ්‍යතා සපුරාලීම සඳහා ව්‍යාපෘති සකස් කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙයෙහවීම. |
| **සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමණාකරන)** | 1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ව්‍යාපෘති කළමනාකරණය සඳහා රාමුවක් වැඩිදියුණු කිරීම මගින් ක්‍රියාවලි ප්‍රමිතීන් නිර්වචනය කර පවත්වාගෙන යාම.<br>2. ව්‍යාපෘති ක්‍රමවේද, ව්‍යාපෘති ප්‍රගති නිරීක්ෂණය සහ ව්‍යාපෘති සහාය ස්ථාපිත කිරීම.<br>3. ව්‍යාපෘති කාලෝචිත ලෙස නිම කිරීම සහතික කරමින් ස්ථාපිත සහ විකාශනය වන ව්‍යාපෘති කළමනාකරණ රාමුවට අනුකූලව සියලුම ව්‍යාපෘති කළමනාකරණය සහතික කිරීම සඳහා අධ්‍යාපනය, පුහුණුව සහ උපදේශන කාර්යභාරය ඉටු කිරීම.<br>4. ව්‍යාපෘති හිමිකරුවන් සමඟ සමීපව කටයුතු කර ප්‍රධාන ව්‍යාපෘති ලැයිස්තුව, ප්‍රධාන ව්‍යාපෘති අයවැය, ප්‍රධාන ව්‍යාපෘති මුදල් ප්‍රවාහය සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල සකස් කිරීම.<br>5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සියලුම ව්‍යාපෘතිවල සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය කළමනාකරණය කිරීම.<br>6. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කළමනාකරණය සඳහා වරින් වර ව්‍යාපෘති තත්ව වාර්තා සම්පාදනය කිරීම සහ ව්‍යාපෘති ප්‍රගති අධීක්ෂණ පුවරු පවත්වාගෙන යාම |
| **සහකාර අධ්‍යක්ෂ (පාලන)** | 01. ප්‍රසම්පාදන කටයුතු, ගබඩා, සංචිත වාහන කළමනාකරණය සහ උපයෝගිතා සේවා අධීක්ෂණය ඇතුළුව සැපයුම් සේවා පිළිබඳ සමස්ත වගකීම.<br>02. ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ සහ උපකරණ සහ අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ ඇතුළුව වත්කම් පාලනය අධීක්ෂණය කිරීම.<br>03. ලේඛනාගාරය ඇතුළුව සාමාන්‍ය පරිපාලනයට අදාළ සියලුම කටයුතු මෙහෙයවීම. |
| **සහකාර අධ්‍යක්ෂ (සැලසුම් සහ ආයතනික කටයුතු)** | 1. ආයතනික සැලසුම්, උපායමාර්ගික සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සහ එම සැලසුම් සහ වැඩසටහන් වරින් වර සමාලෝචනය කිරීම.<br>2. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ කාර්ය සාධනය ඉහළ කළමනාකාරිත්වයට වාර්තා කිරීම<br>3. විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා සහාය වීම.<br>4. වාර්ෂික වාර්තා සහ අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතු කාලානුරූප වාර්තා සකස් කිරීම<br>5. කාර්යාලීය ක්‍රියා පටිපාටිවලට අදාළ නිල චක්‍රලේඛ, රීති සහ රෙගුලාසි සැකසීම, විභාග කිරීම සහ ඒවාට අනුකූල වීම<br>.6. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සාමාන්‍ය කාර්යයන් සම්බන්ධයෙන් අතිගරු ජනාධිපති කාර්යාලය, ජනාධිපති ලේකම් කාර්යාලය, කැබිනට් ලේකම් කාර්යාලය, භාණ්ඩාගාරය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අනෙකුත් නියාමන ආයතන සහ ව්‍යවස්ථාපිත අධිකාරීන් සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ මෙහෙයවීම.<br>7. විගණකාධිපති දෙපාර්තමේන්තුව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) සහ අනෙකුත් පාර්ලිමේන්තු කාරක සභාවලට අදාළ කටයුතු මෙහෙයවීම.<br>8. ආයතනික සමාජ වගකීම් අරමුදලට අදාළ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම. |

වගුව 1

**අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම්:**

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් 2 වන වගුවේ සඳහන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ පළමු හෝ දෙවන පන්තියේ (විශේෂ) උපාධිය.

**හෝ**

2 වන වගුවේ සඳහන් අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික/ආශ්‍රිත සාමාජිකත්වය.

**සහ**

**අවශ්‍ය පළපුරුද්ද**

වගුව 2 හි සඳහන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්ද.

හෝ

දීප ව්‍යාප්ත සේවාවක නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා පළපුරුද්ද.

**අවශ්‍ය වෙනත් සුදුසුකම්**

සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන්ට කොමිසම විසින් තීරණය කරනු ලබන පරිදි දත්ත සමුදා කළමනාකරණය සහ සම්මත මෘදුකාංග පැකේජ පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු වීම .

සහ

කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ඉංග්‍රීසි සහ සිංහල / දෙමළ භාෂා පිළිබඳ විශිෂ්ට සන්නිවේදන කුසලතාවය (ලිඛිත සහ වාචික)

**වයස:** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප :** TRC 2.2 - 93,840 - (10x1955)-(10x2346)-(10x3128) -168,130

බඳවා ගැනීමේ පටිපාටිය - ලිඛිත තරඟ විභාගය සහ ඉන් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි. .

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් සඳහා විෂයය ක්ෂේත්‍ර | වෘත්තීය සුදුසුකම් සඳහා විෂයය ක්ෂේත්‍ර | ක්ෂේත්‍ර පළපුරුද්ද: |
|---|---|---|---|
| **සහකාර අධ්‍යක්ෂ (ජාල)** | විදුලි සංදේශ හෝ ඉලෙක්ට්‍රොනික හෝ විදුලි ඉංජිනේරු හෝ තොරතුරු තාක්ෂණය | විදුලි සංදේශ හෝ ඉලෙක්ට්‍රොනික හෝ විදුලි ඉංජිනේරු හෝ තොරතුරු තාක්ෂණය | විදුලි සංදේශ හෝ ඉලෙක්ට්‍රොනික හෝ විදුලි ඉංජිනේරු හෝ තොරතුරු තාක්ෂණය |
| **සහකාර අධ්‍යක්ෂ (තරඟකාරිත්ව)** | අලෙවි කළමනාකරණය හෝ විදුලි සංදේශ හෝ මූල්‍ය හෝ වාණිජ හෝ ආර්ථික විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යාලේඛන | අලෙවි කළමනාකරණය හෝ විදුලි සංදේශ හෝ මූල්‍ය හෝ වාණිජ හෝ ආර්ථික විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යාලේඛන | අලෙවිකරණ කළමනාකරණය හෝ විදුලි සංදේශ හෝ මූල්‍ය වාණිජ්‍ය හෝ ආර්ථික විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යාලේඛන |
| **සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)** | මූල්‍ය හෝ ගිණුම්කරණය හෝ වාණිජ්‍යය | මූල්‍ය හෝ ගිණුම්කරණය හෝ වාණිජ හෝ කළමනාකරණ ගිණුම්කරණය | මූල්‍ය හෝ ගිණුම්කරණය හෝ වාණිජ්‍යය |
| **සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති යටිතල පහසුකම් නඩත්තු සහ සංවර්ධන)** | සිවිල් ඉංජිනේරු | සිවිල් ඉංජිනේරු විද්‍යාව | සිවිල් ඉංජිනේරු |
| **සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකරණ)** | විදුලි ඉංජිනේරු විද්‍යාව | විදුලි ඉංජිනේරු විද්‍යාව | ව්‍යාපෘති කළමනාකරණය |
| **සහකාර අධ්‍යක්ෂ** (පාලන) | රාජ්‍ය පරිපාලනය හෝ රාජ්‍ය ප්‍රතිපත්ති හෝ මානව සම්පත් සංවර්ධනය හෝ ව්‍යාපාර පරිපාලනය | රාජ්‍ය පරිපාලනය හෝ රාජ්‍ය ප්‍රතිපත්ති හෝ මානව සම්පත් සංවර්ධනය හෝ ව්‍යාපාර පරිපාලනය | රාජ්‍ය පරිපාලනය හෝ රාජ්‍ය ප්‍රතිපත්ති හෝ මානව සම්පත් සංවර්ධනය හෝ ව්‍යාපාර පරිපාලනය |
| **සහකාර අධ්‍යක්ෂ (සැලසුම් සහ ආයතනික කටයුතු)** | රාජ්‍ය පරිපාලනය හෝ රාජ්‍ය ප්‍රතිපත්ති හෝ සැලසුම් හෝ ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යානය හෝ ආර්ථික විද්‍යාව හෝ විදුලි සංදේශ හෝ විද්‍යාව | රාජ්‍ය පරිපාලනය හෝ රාජ්‍ය ප්‍රතිපත්ති හෝ සැලසුම් හෝ ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යානය හෝ ආර්ථික විද්‍යාව හෝ විදුලි සංදේශ හෝ විද්‍යාව | රාජ්‍ය පරිපාලනය හෝ රාජ්‍ය ප්‍රතිපත්ති හෝ සැලසුම් හෝ ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යානය හෝ ආර්ථික විද්‍යාව හෝ විදුලි සංදේශ |

වගුව 2

**අයදුම් කිරීමේ ක්‍රමය**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk. වෙතින් බාගත කර ගත හැකිය.
2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2025.03.05 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **සහකාර අධ්‍යක්ෂ /............ (විෂයය)තනතුරට බඳවා ගැනීම (බාහිර) - 2025** යනුවෙන් සඳහන් කළ යුතුය.
6. අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lkවිද්‍යුත් තැපෑලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව "**සහකාර අධ්‍යක්ෂ /............ (විෂයය)තනතුරට බඳවා ගැනීම (බාහිර) - 2025**" විය යුතුය.
7. රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
8. අයදුම්පත් **2025.03.05 දින හෝ එදිනට** පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

**පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා සෘජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක 276
ඇල්විටිගල මාවත
කොළඹ 08